# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2269/77 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මැදදුම්බර පන්විල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, මොරගහඔය කලාපයේ වටපාන ජල ගබඩා ටැංකිය (MR 3) ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/438.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 761, මඩපොළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වටපාන ගමේ පිහිටි, "හිත්ගැහැනවලහේන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 40 ක් පමණ වන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ඊ. එම්. ආර්. සේනානායක හිමිකම් කියන ඉඩම් කොටස ; |
| *දකුණට* | : | ඊ. එම්. ආර්. සේනානායක හිමිකම් කියන ඉඩම් කොටස හා ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | ප්‍රවේශ මාර්ගය. |


1A - G 36276 —32 (2022/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : ඒ. එස්. ටී. බී. විජේසිංහ,
සිංහ සමූහ ව්‍යාපාරය,
අංක. 102, සිංහ ගබඩාව,
මහියංගනය පාර,
තෙල්දෙණිය.

EOG 03 - 0767

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගලබොඩඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ දෙකිඳ මාර්ගයේ සිට බව්වාගම දෙසට මිලි මීටර 315 ජල නල එළීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/436.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1083 බව්වාගම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බව්වාගම ගමේ පිහිටි, "හයින්ෆෝර්ඩ් ඒ එස්ටේට්" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 4.36 ක් පමණ වන ඉඩම් කොටස.

මායිම් :
*උතුරට* : විජේන්ද්‍ර භාරති හිමිකම් කියන ඉඩම හා හිමිකරු නොදන්නා වූ ඉඩම ;
*නැගෙනහිරට* : මාර්ගය ;
*දකුණට* : පී. එච්. මංජුල අමරසූරිය හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : නිවාසවලට යන පාර.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : රාසයියා කුමාරසිංහ මයා,
අංක 205/28,
දෙකිඳ පාර,
බව්වාගම, නාවලපිටිය.

EOG 03 - 0768

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.